

# රංගන උදුම්බරා රංගායතනයේ
# සිරිස් පත පැළඳු සිසුවියනගේ කල එළි දැක්ම

නර්තනය යනු හෙළ සංස්කෘතියේ එක් ප්‍රධාන කලාංගයකි. වසර 2500 කට වඩා ඉපැරණි අප සංස-්කෘතිය සේම පැරණි කලාවකි, හෙළ නර්තන කලාව. විජය රජුගේ ක්‍රියාකලාපයෙන් කුපිත කුවේණිය කළ ශාපය යොමු වූයේ පඩුවස්දෙව් නිරිඳුන්ටයි. ඊට සෙත්පතා භාරතයෙන් පැමිණි කට්ටඩින් කළ යාග කර්මය කොහොඹ යක් කංකාරියයි. එහි එන නර්තන රටා අනුවයි උඩරට නර්තන සම්ප්‍රදාය බිහි වුයේ.

ඉහත මුලාශ්‍ර ඇසුරින් නිර්මාණය වූ නර්තන ප්‍රසංගයක් ජූලි මස පස්වනදා බර්වුඩ් හි බීසන් සෙන්ටර් ශාලාවේදී පැවැත්වීමට කටයුතු සම්පාදනය වෙයි. එහෙත් එය හු-දෙක් නර්තන ප්‍රසංගයක් ම නම් නොවේ. නර්තන දස වසරක් තිස්සේ හදාරා ශිල්පීය නිපුණත්වයට සපැමිණි යෞවනියන් දස දෙනෙකුගේ කල එළි මංගල්‍යයකි. ඔවුහු මේ වන විටත් සිරස් පත පැළඳවීමේ මංගල්‍යයට සහභාගීව කාන්තා නර්තන වෙස් දරා හමාරයි.

රංගන හා උදුම්බරා නැටුම් ඇදුරන් දෙපළගෙන් ශිල්ප හැදෑරූ මෙලිසා අධිකාරී, නිපුනි බණ්ඩාරනායක, නිපුනි දිසානායක, අමන්දා ජයතිලක, යසිරු කරුණාරත්න, අරුණි මාපා, කුෂානි පෙරේරා, විනුෂි පෙරේරා, සචිනි පෙරේරා සහ ලංකා වික්‍රමාරච්චි යන සිසුවියන් හට පසුගිය දා කීස්බරෝ හි ධම්මසරණ විහාරස්ථානයේ දී සිය ගුරු යුවල අතින් සිරස් පත පළඳනාවන් පළඳවන ලදී. දෙමව්පියන් ද පෙරදැරිව පිරිත් සජ්ජායනා සහ මගුල් බෙර වාදන මධ්‍යයේ විහාරයේ බුදු පිළිම වහන්සේ



සිසිර දිසානායක

ඉදිරිපිට දී සිය හිස් පළඳනා පැළැඳු ඔවුනගේ හිස් සුදු පිරුවට වලින් නැතහොත් "වහන්තරා" වලින් වසන ලදී. මේ වහන්තරා නිරාවරණය කරන ලද්දේ බෝධිඝරය ඉදිරිපස තබන ලද "කිරි ගසක" ගලනා කිරි දැකීමට සැළසෙන ලෙසයි. අනතුරුව පසෙක වූ දිය කොරහා වෙත ඔවුන් ව යොමු කළේ සිරස් පත සිය මුහුණ පමණක් මුලින්ම තමන්ට පෙනෙන සේය. තමා පිළිබඳව ඇති කරගත් ආත්මාභිමානයෙන් යුතුව මෙම සිසුවියන් සිය මුල් ම නර්තනය චෛත්‍ය ඉදිරිපිට නැටුවේ "මංගලම්" ගායනය හා බෙර වාදන මාධ-්‍යයේයි. ඇස්වහ දුරු කරවනු වස් නැවත වරක් බෝධීන් වහන්සේ ඉදිරිපිට දී සිරිත් විරිත් ඉටු කරනා ලද්දේ රංගන නැටුම් ඇදුරිඳු විසින්.

මීට වසර කීපයකට පෙර රංගන-උදුම්බරා යුවල වෙතින් ශිල්ප හැදෑරූ දැරියන් තිස් දෙනෙකු හට පා පළඳනාව වන "සිලම්බු" පළඳවන ලදී. ඒ තිස් දෙනා අතින් හිස් පළඳනාව පැළඳීමට වරම් ලැබ-ුයේ ඉහත කී මානවිකාවන් දස දෙනා පමණකි.

"අවුරුදු දහයක් තිස්සේ නොකඩවා අපේ පන්ති වලට ඇවිත්, හරියාකාරව පුහුණු වීම් කරලා තමන්ගේ උපන් හැකියාව වැඩි දියුණු කරගත්ත ළමයි දහ දෙනෙක් තමයි අපි මේ විදියට තෝරා ගත්තෙ....." උදුම්බරාවන් අප හා පිළිසඳරට එක් වූවාය.

"මුලින්ම මේ අය තමන්ගෙ දෙමව්පියන්ගේ අතේ එල්ලිලා ආවෙ දෙමව්පියන්ගේ උනන්දුව නිසා. ඒ අතින් අපි ඒ දෙමව්පියන්වවත් අගය කරන්න ඕන. මේ දරුවෝ දහ දෙනාම ඉපදිලා තියෙන්නෙ මෙහෙදි. ඒත් ඒ අයගෙ දෙමව්පියන්ට තමුන්ගේ මව් රටේ දේවල් ගැන වටිනාකමක් තිබුණ හන්දා-නේ අද මේ විදියට අපි කවුරුත් සතුටු වෙන්නේ" රංගනයන් ද අපට එක් වෙයි.

"ඇත්තට ම අපේ පන්ති වලට අවුරුදු දහය සම්පූර්ණ වෙන්නෙත් මේ අවුරුද්දේ. ඒ අතින් අපි මේ සමරන්නේ අපේ දහවෙනි සංවත්සරය".

තම පශ්චාත් උපාධිය සඳහා රංගනත්, උදුම්බරාත් මෙහි පැමිණියේ ජනාධිපති අරමුදලින් ලැබෙන ශිෂ්‍යත්ව දෙකක් ලබාගෙනයි. ඒ අනුව උදුම්බරා රංගන වින්‍යාසයත්, රංගන ව්‍යාපාර කළමණාකරණය හා වෘත්තීය ගණකාධිකරණයත් ඉගෙන ගනිමින් සිය පශ්චාත් අධ්‍යාපනය නිමා කළහ. සෞන්දර්ය විශ්ව විද්‍යාලයේ මුලික උපාධිය ලබා කොළඹ විශ්ව විද්‍යාලයේ කථිකාචාර්යවරියක ලෙස සේවය කළ උදුම්බරා අද මෙල්බන් විශ්ව විද්‍යාලයට අනුබද්ධිත "වික්ටෝරියන් කොලෙජ් ඔෆ් ද ආර්ට්ස්" හි බාහිර කථිකාචාර්යවරියකි. පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ උපාධිධරයෙකු වන රංගන මව්බිමේ දී මානව සම්පත් කළමණාකාරවරයෙකු ලෙස සේවය කළ අතර, දැනට මෙහි එන්.ඒ.බී. බැංකුවේ ක්ලේටන් ශාඛාවේ කළමණාකාරවරයායි.

"දහවෙනි සංවත්සරය සමරන මේ වෙලාවේ මුලදී අපට අත දුන්න මාලනී ජයසිංහ, කරු ලියන-ාරච්චි, රමණී ලියනාරච්චි, ජය ශ්‍රී චන්ද්‍රජිත්, දයා උඩවෙල,අමරසිංහ අමුණුගම, වාගේ අය මතක් කරන්නෙ ස්තුති පූර්වකව. ඒ වගේ ම අපේ ශිෂ-්‍යයින්ගේ දෙමව්පියන් අපිත් එක්ක මේ ආ ගමන හරි වටිනවා." ඒ රංගන.

"ඉතින් දැන් ඊළගට මොකද වෙන්නේ ? ඔවුන්ගේ ඉදිරි පියවර පිළිබඳව විමසිලිමත් වුයෙමු, අපි.

"දැන් භරත නැටුම් වල අරංගේත්‍රම් උත්සවයක් කරන්නෙ ඇයි? ඒ ශිෂ්‍යයින්ට දිග වෙලාවක් නැටුමට තමන්ගේ අවධානය යොදවලා නටන්න පුළුවන් බව පෙන්වන්න. ඒ වගේ ම ඒකට අවශ්‍ය ශක්තිය තියෙන බව පෙන්වන්න. ඒ තමයි වෘත්තීය ශිල්පියෙකුගේ ලක්ෂණ. ඉතින් මේ දේවල් පෙන්වන්න අපේ නැටුම් ශිල්පයේ දී කරන්නේ කල එළි මංගල්‍යයක් පවත්වන එකයි."

"මොන විදියට ද ඉතින් මේ ප්‍රසංගය ඉදිරිපත් වෙන්නේ?" අප මෙම සාකච්ඡාවට පූර්විකාව සපයා ගත් පැණයයි ඒ.

"අපේ නැටුම් වල ඉතිහාසය දැක්වෙන විදියේ නැටුම් අංග රැසක් පෙළගන්වලා තියෙනවා. ලංකාවේ නැටුම් සම්ප්‍රදායන් වගේම ඉන්දියාවේ ශාස්ත්‍රීය නැටුම් සම්ප්‍රදායන් සියල්ල මේ ප්‍රසංගයට ඇතුලත්. දිගටම බෙර පද වලට නටන නැටුම් වලින් ඒකාකාරී බවක් ඇතිවෙන්න පුළුවන් නිසා නිර්මාණය කරපු සංගීත අංග වලටත් නැටුම් ඉදිරිපත් කරනවා. මේ සංගීතාංග නිර්මාණය කලේ තරුපති මුණසිංහ කියන තරුණ සංගීතඥයා. එදාට වේදිකාවේ සජීවීව කරන වාදන මෙහෙය වන්නේ ඩී.ඩී. ගුණසේන කියන දක්ෂ වයලීන් වාදන ශිල්පියායි".

"මේ ප්‍රසංගයේ නැටුම් ඉදිරිපත් කරන්නේ මේ සිසුවියන් දහදෙනා විතරයි. ඉතින් ඒ අතරට මේ නැටුම් ගැන කියා දෙන්න ඒ ගැන හොඳට උගත් කෙනෙක්ගේ උපකාරය ඕන කළා. ඉතින් මම ආර-ාධනා කළා මගේ විශ්ව විද්‍යාලයේ ගුරුතුමෙකුට. එතුමා තමයි මහාචාර්ය මුදියන්සේ දිසානායක මහත්මයා. ලංකාවේ නැටුම් පිළිබඳව මුල්ම මහාචාර්ය තුමයි ඒ. එතුමා උඩරට, පහත-රට නැටුම් සම්ප්‍රදාය දෙක පරතෙරට උගත් වියතෙක් සබරගමු නැටුම් සම්ප්‍රදාය ප්‍රගුණ කරපු ආචාර්ය ශ්‍රියානි රාජපක්ෂ මහත්මියටත් අපි ආරාධනා කළා මේ ප්‍රසංගයට සහභාගී වෙන්න. එතුමිය ලංකාවේ නැටුම් පිළිබඳව මුල් ම ආචාර්යතුමියයි". උදුම්බරා සැකෙවින් විස්තර කළාය.

"මේ මෙල්බන් වල මුල්ම කලඑළි මංගල්ලය බලන්න එන්න කියලා අපි හැමෝටම ආදරයෙන් ආරාධනා කරනවා. නැටුම් ශිල්පිනියක් විදියට එළි බසින මේ තරුණියන් දහ දෙනාට ඔබ හැමෝගෙම ආශීර්වාදය එක් කරන්න, සතුට පළ කරන්න මේ හොඳ අවස්ථාවක්!"

රංගන දෙපළ වෙනුවෙන් හා දෙමව්පියන් වෙනුවෙන් ආරාධනා කළේය. අපි ඔවුනටත් සිසුවියන්ටත් සුභ පැතුවෙමු.

විමසීම් - කපිල වංශතිලක - 0408998724
නන්දන පෙරේරා - 0401313247


MONT ALBERT DENTISTS P/L
For all Your Dental Requirements
We Provide
GENERAL DENTAL TREATMENT
COSMETIC DENTAL
TEETH WHITENING
PARTIAL/FULL DENTURES
EMERGENCY SERVICES
WE ACCEPT COMMUNITY DENTAL VOUCHERS, TEEN VOUCHERS, ALL PRIVATE HEALTH INSURANCES AND MEDICARE VOUCHERS FOR APPROVED PATIENTS.
FOR APPOINTMENTS 9890 3609
DISCOUNTS FOR FAMILIES, FREE CHECK UPS FOR KIDS UNDER 7 YEARS
DR. ENOKA JAYATILAKEBANDA (BDS)
MONT ALBERT DENTISTS
2A CHURCHILL ST
MONT ALBERT VIC 3127
(CLOSE TO BOX HILL CENTRAL)
www.montalbertdentists.com.au



සන්නස
බලන්නට ඇති පත්තර අතර
කියවන්නට ඇති පත්තරයක්